ඇමුණුම 01

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග 119 (4) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය :- මොනරාගල

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු	**එම අඩුපාඩු වළක්වා ගැනීමට ආයතනය විසින් ගත් ක්‍රියාමාර්ග / වර්තමාන ප්‍රගතිය**
ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වා නොතිබීම	නිලධාරීන් දැනුවත් කරන ලදී. ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු සිගාස් වැඩසටහනෙහි යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන අතර ඉඩම් හා ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් ලද පසු යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.
අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම	නිලධාරීන් දැනුවත් කරන ලදී. සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
දීර්ඝකාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම	නිලධාරීන් දැනුවත් කරන ලදී. සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දීර්ඝකාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යනු ලැබේ.
වියදම් උපයෝගිතා ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබීම	නිලධාරීන් දැනුවත් කරන ලදී වියදම් උපයෝගිතා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලැබේ.
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබීම	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇතත් නියමිත ආකෘතිය භාවිතා කර නොතිබුණි. මේ පිළිබඳව නිලධාරීන් දැනුවත් කරන ලදී. 2023 හා 2024 වර්ෂවල නියමිත ආකෘතිය භාවිතා කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත.
විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම් සඳහා මාසයක් ඇතුලත දී පිළිතුරු ඉදිරිපත් නොකිරීම	පිළිතුරු ලබා දීමට කල්ගත වන අවස්ථාවන්වල දී අතුරු පිළිතුරු යැවීමට කටයුතු කර ඇති අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන විමසුම්වලට අදාළ සියලු නිලධාරීන් කැඳවා විගණන සාකච්ඡාවන් පවත්වා කඩිනමින් පිළිතුරු ලබාගැනීම, විගණන විමසුම් ලද වහාම කඩිනමින් පිළිතුරු ඉදිරිපත් කිරීම සඳහා නිලධාරීන් දැනුවත් කිරීම ආදී ක්‍රියාමාර්ග ගැනීම තුලින් විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම අවම කර ගැනීමට කටයුතු කර ඇත.

අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මාසයක් ඇතුලත දී පිළිතුරු ඉදිරිපත් නොකිරීම	මේ පිළිබඳව ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටුවල දී අදාල නිලධාරීන් දැනුවත් කර ඇති අතර නිරන්තරව පසුවිපරම් කරමින් පෙළඹවීම් සිදු කරනු ලැබේ. එහිදී විගණන නිරීක්ෂණවලට අදාල ගුණාත්මක පිළිතුරක් සකස් කිරීම හා එක් එක් නිරීක්ෂණ පිළිබඳව ක්‍රියාමාර්ග ගත යුතු ආකාරය සාකච්ඡා කරනු ලැබේ. අභ්‍යන්තර විගණන විමසුම් සඳහා පිළිතුරු ලබාදීම ප්‍රමාදවීම අවම කර ගැනීමට හැකි වී ඇත.
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල විගණන කමිටුව අවම ප්‍රමාණයෙන් හෝ රැස් වී නොතිබීම	රටෙහි පැවැති අර්බුදකාරී වාතාවරණය තුල 2022 වර්ෂයේ, සැලසුම් කළ පරිදි ප්‍රාදේශීය විගණන කළමනාකරණ කමිටු පැවැත්වීමට නොහැකි වූ නමුත් කමිටු වාර 32ක් පවත්වා ඇත. විගණන කළමනාකරණ කමිටු පැවැත්වීම පිළිබඳ විශේෂ අවධානය යොමුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලද අතර 2023 වර්ෂයට අදාලව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 තුල ප්‍රාදේශීය විගණන හා කළමනාකරණ කමිටු 44ක් නියමිත පරිදි පවත්වා ඇත.
2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේදි මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම	අදාල චක්‍රලේඛය ප්‍රකාරව 2018 වර්ෂයේදි මිල දී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර ඇත. 2023.08.24 දිනැති අංක 06/2023 වත්කම් චක්‍රලේඛය අනුව අදාල තොරතුරු වාර්තා කර ඇත. කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් වරින් වර ඉල්ලන ලද තොරතුරු නියමිත පරිදි වාර්තා කරනු ලැබේ.
සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත වාර්තා කර නොතිබීම	අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. නියමිත පරිදි සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත වාර්තා කරනු ලැබේ.
වාහනයක් ගර්හිත වී මාස 08ට වඩා අඩු කාලයකදි අපහරණය කර නොතිබීම	අංක UP GN 8137, 43-3028, 150-6038, 131-3049 යන වාහන 2024.06.12 දින අපහරණය කර ඇත. අනිකුත් වාහන අපහරණය කිරීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවති.

<table>
<tr>
<td>වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම</td>
<td>

පළාත් සභා ණය ශේෂ මේ වන විට අය කර අවසන්ව ඇත.
ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 වගන්තිය අනුව මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ අය කර ගැනීම සඳහා නීතිපති උපදෙස් ඉල්ලා ඇත. එක් නිලධාරියෙකුගේ ණය ශේෂය ගෙවා අවසන් කර ඇත.
වැඩ තහනම් නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂ මාසිකව අය කර ගැනීමට උපදෙස් ලබා දී ඇත.එක් නිලධාරියෙකුගේ ණය ශේෂය ගෙවා අවසන් කර ඇත.
සේවය අතහැර ගොස් ඇති එක් නිලධාරියෙකුගේ ණය ශේෂ මාසිකව අය කර ගැනීමට උපදෙස් ලබා දී ඇත. එක් නිලධාරියෙකුගේ ණය සම්පූර්ණයෙන් අය කර ඇත.

ණය ශේෂ විස්තරය
<table>
<tr><th>නිලධාරියාගේ නම</th><th>2022.12.31 දිනට ශේෂය</th><th>2024.07.31 දිනට ශේෂය</th></tr>
<tr><td><u>පළාත් සභා</u></td><td></td><td></td></tr>
<tr><td>W A ජයසිංහ</td><td>102,719.49</td><td>0</td></tr>
<tr><td><u>මියගිය</u></td><td></td><td></td></tr>
<tr><td>D D පියදාස</td><td>784,190.40</td><td>784,190.40</td></tr>
<tr><td>S D කීර්තිසිංහ</td><td>227,203.20</td><td>227,203.20</td></tr>
<tr><td>H W K රංජනී</td><td>61,600.00</td><td>0</td></tr>
<tr><td><u>වැඩතහනම්</u></td><td></td><td></td></tr>
<tr><td>D G C ජයවර්ධන</td><td>36,579.00</td><td>0</td></tr>
<tr><td>A M සීලවති</td><td>231,400.00</td><td>183,900.00</td></tr>
<tr><td>J M හෙට්ටිආරච්චි</td><td>171,356.64</td><td>162,356.64</td></tr>
<tr><td><u>සේවය අතහැර ගිය</u></td><td></td><td></td></tr>
<tr><td>K M හම්සා</td><td>13,864.23</td><td>0</td></tr>
<tr><td>W A K තිලක්</td><td>230,658.00</td><td>230,658.00</td></tr>
<tr><td>එකතුව</td><td>1,859,570.96</td><td>1,588,308.24</td></tr>
</table>
</td>
</tr>
<tr>
<td>කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු නොකිරීම</td>
<td>අදාල අංශ දැනුවත් කර නිරවුල් කර ගැනීමට කටයුතු කිරීම හා නිරවුල් කළ නොහැකි තැන්පතු රජයේ ආදායමට බැර කිරීම සිදු කර ඇත.

2022 වර්ෂයේ පැවැති කල් ඉකුත් තැන්පතු සියල්ල මේ වන විට නිරවුල් කර ඇත.</td>
</tr>
</table>

මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්ත්කාර්ය අතුරු අග්‍රිම කාර්ය නිම වී දින 10 ඇතුලත නිරවුල් කර නොතිබීම	තත්ත්කාර්ය අතුරු අග්‍රිම, කාර්ය නිම වී දින 10 ඇතුලත නිරවුල් කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. ලබා ගන්නා ලද අතුරු අග්‍රිමවලින් වැඩි ප්‍රමාණයක් කාර්යය නිම වූ වහාම පියවීමට කටයුතු කර ඇත.
අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් හැර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන තිබීම	අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් හැර අනුමත සීමාව ඉක්මවා කාර්ය මණ්ඩලය බඳවාගෙන නොමැති බව වාර්තා කරමි.
මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබීම	රටෙහි පැවැති අර්බුදකාරී වාතාවරණය තුල 2022 වර්ෂයේ සැලසුම් කළ පරිදි දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි විය. 2023 වර්ෂයේදී රැස්වීම් වාර 08ක් හා 2024 වර්ෂයේ මේ වන විට රැස්වීම් වාර 04ක් පවත්වා ඇත. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් මාසිකව පැවැත්වීමට සැලසුම් කළ ද දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිතුමන්ලාගේ ඉල්ලීම මත එම රැස්වීම් අවලංගු කිරීමට සිදුවන බැවින් අඛණ්ඩව මාසික දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පැවැත්වීම ගැටළුකාරී වී ඇත.
දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශීය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබීම	2024 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි, මාර්තු මාසවල ප්‍රාදේශීය ලේකම් සමුළු 03ක් පවත්වා ඇති අතර මැයි මස සිට සතියකට වරක් ZOOM තාක්ෂණය ඔස්සේ ප්‍රාදේශීය ලේකම්වරුන් සම්බන්ධ කරගනිමින් සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය හා දැනුම් දිය යුතු කාරණා පිළිබඳව සාකච්ඡා කරනු ලැබේ.
දිස්ත්‍රික් නිවාස කමිටුව මාසිකව රැස් වී නොතිබීම	දිස්ත්‍රික් නිවාස කමිටුව පැවැත්වීමේ වගකීම නිවාස සංවර්ධන අධිකාරිය සතුවන අතර මාසිකව නිවාස කමිටුව පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලෙස නිවාස සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇත.
දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටුව මාසිකව රැස් වී නොතිබීම	චක්‍රලේඛ උපදෙස් පරිදි මාසික රැස්වීම් පවත්වන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදි. 2024 වර්ෂයේ මේ වන විට දිස්ත්‍රික් පොහොර සම්බන්ධීකරණ කමිටු 07ක් පවත්වා ඇත.
දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටුව මාසිකව රැස් වී නොතිබීම	රටෙහි පැවැති ආර්ථික අර්බුදකාරී වාතාවරණය තුල නිරන්තරව මිල ගණන් වෙනස්වීම නිසා මිල නියම කිරීමේ කමිටු රැස්වීම මාසිකව පවත්වනු ලැබුවත්, වර්තමානයේ එය සාමාන්‍ය තත්ත්වයට පත්ව ඇති බැවින් මිල නියම කිරීමේ කමිටු රැස්වීම මාස 06 ට වරක් පැවැත්වීම ප්‍රමාණවත් බව දන්වා සිටිමි.
සකස් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අතිරේක	මේ පිළිබඳව අවධානය යොමුකර 2024 වර්ෂයේ පුහුණු සැලැස්ම සකස්කර ක්‍රියාත්මක කරනු ලැබේ.

පුහුණුවක් නියම කර නොතිබීම	
දිස්ත්‍රික් හා ප්‍රාදේශිය මත් ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබීම	2024 වර්ෂයේ ගෙවී ගිය කාර්තු 02 සඳහා දිස්ත්‍රික් මත් ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම 02ක් හා ප්‍රාදේශිය මත් ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් 21ක් පවත්වා ඇත.
ළමා අයිතිවාසිකම් පිළිබඳ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටුව කාර්තුවකට 01 බැගින් රැස් වී නොතිබීම	නිලධාරීන් දැනුවත් කරන ලදී. 2023 වර්ෂයේ දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු 04ක් හා 2024 වර්ෂයේ මේ දක්වා කමිටු 02ක් පවත්වා ඇත.
සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතීම	2024 වර්ෂයේ පුහුණු සැලැස්මට අනුව අදාල පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මේ වන විට පුහුණු වැඩ සටහන් 08ක් පවත්වා ඇත.
උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථානමාරු කර යැවීමට කටයුතු කර නොතිබීම	උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු හා සේවා අවශ්‍යතා මත රඳවාගත යුතු නිලධාරීන් පිළිබඳ තොරතුරු මාරු මණ්ඩල වෙත ඉදිරිපත් කර ඇත. මොනරාගල දිස්ත්‍රික්කය තුල අවම රාජ්‍ය ආයතන සංඛ්‍යාවක් පැවතීම හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක් අතර පවතින දුර ප්‍රමාණය සැලකිය යුතු තරම් අධික වීම නිසා ඒ අතර ඇති ප්‍රවාහන අපහසුකම් ආදිය ද ස්ථානමාරුවීම් ක්‍රියාක්මක නොවීමට හේතු වී ඇත. 2025 වර්ෂයේ වාර්ෂික ස්ථානමාරු ක්‍රියාත්මක වීමෙන් පසු ස්ථානමාරු ලබා නොමැති, උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් සඳහා අභ්‍යන්තර ස්ථානමාරු (ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර) ක්‍රියාක්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.
දිස්ත්‍රික් පරිසර කමිටු අවම වශයෙන් මාස 02කට වරක් රැස් වී නොතිබීම	2024 වර්ෂයේ දිස්ත්‍රික් පරිසර කමිටු 03ක් පවත්වා ඇති අතර අවශ්‍යතාවය අනුව රැස්වීම් කැඳවනු ලැබේ.

දිස්ත්‍රික් ලේකම් / දිසාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

ආර්.එම්. පසන් රස්.බී. රත්නායක
දිස්ත්‍රික් ලේකම් /දිසාපති
මොනරාගල

ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
මොනරාගල

[illegible] නිර්දේශය

[illegible] පැත්තෙන් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් [illegible] යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

[illegible]

ප්‍රදීප් යසරත්න
ලේකම්
[illegible] පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා
හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"සිසු මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

[illegible] පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ලේකම්තුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (හා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය